# ප්‍රියේ නුඹම උපනුපන් ජාති හමුවේවා

# ප්‍රේමණීය ප්‍රේමකීර්ති

වෙනුවෙන් බොහෝ කවි ප්‍රමාණයක් ලියුව .තමන්ගේ ගුරුවරයට කරන ගෞරවයක් හැටියට තමයි එක කලේ .අනිත් කරුණ තමයි තමන්ට කියා ගන්න දරාගන්න බැරි සිදුවීමක් සිදු උනාම ප්‍රේම් කලේ එක කවියට නගා අර දුක තුනී කර ගැනීමයි .සරල සුන්දර තේරුම් ගැනීමට පහසු උපමා උප-මෙයන්ගෙන් සමන්විත භාෂා මාද්‍යක් තමයි ප්‍රේම් කවිය වෙනුවෙන් යොදාගත්තේ .ඔහුගේ කවිවල හා ගීතවල උඩින් නොපෙනෙන මහා ගැඹුරු හරයක් තිබුන .මම හිතන්නෑ මම ඔහුගේ ගීත සහ කවි ගැන කතා කරන්න සුදුස්සෙකුවත් කියල .මන්ද ඔහුගේ කවිය ගීතය ගැන කතාකරනවානම් වෙනමම විදිහකට අපි කතා කලයුතුයි .ගීත නිර්මාණය සඳහා වූ ප්‍රේමකීර්තිගේ හැකියාව ඇත්තටම අසම සමයි .ප්‍රේමකීර්ති කියන්නේ රටකට ඒ රටේ කලාවේ වාසනාවට කලාතුරකින් බිහිවෙන නිර්මාණ කරුවෙකුයි .ඔහු හැදී වැ-ඩෙන්නේ කොළඹ ,අධ්‍යාපනය ලබන්නේ කොළඹ ආනන්ද විදුහලින් ඔහුගේ භාෂා ඥානය ඔහු ජීවත්වූ පරිසරය අභිබවා ගිය පුළුල් පරාසයක විහිදුන එකක් .ඔහු කිසිම දවසක මේසෙකට වෙලා පොතක් කියවනවා මම දැකල නැහැ .හැබැයි බත් එක ඔතල දෙන පත්තර කොළයනම් අනිවාර්යෙන්ම කියවනවා .

සොමලතා ද අල්විස් කියලා එකම සොහොයුරියක් තමයි ප්‍රේම්කීර්තිට හිටියේ .සයිමන් ද අල්විස් සහ අමරා දී ගුණතිලක යන දෙපල තමයි ප්‍රේම්ගේ දෙමවුපියන් වන්නේ .

ඒ ජූලි මාසයේ බොහෝ පුදුම දේවල් සිදුවුනා .ඉස්සෙල්ලාම පුතා අසනීප වුනා .මේ වෙද්දී ප්‍රේම්ට මහියංගනේ ගම්උදාවට සමගාමීව ආයුබෝවන් වැඩසටහනක් කරන්න මහියංගනයට යන්න වෙලයි තිබුනේ .භීෂණයේ උච්චතම කාළය තමයි මේ.ප්‍රේමකීර්ති එකපාරටම අම්ම වෙනුවෙන් සාංගික ධානයක් දෙන්න ඕන කියල ඒක ජූලි නවවෙනිද සිදුකරනවා .පසුව අම්මගේ සොහො-හොන් කොත හදන්න ඕන කියල ඒ වැඩෙත් නිමකළා . ජූලි 30 වෙනිදා ඝාතනය වෙන්න ඉස්සෙලා දවසේ එයා නෑදෑයෝ බලන්න ඕන කියල වාද්දුවේ ඉන්න නෑයෝ බලන්න ගිය .ඒ ගිහිල්ල එනකොට අසනීප වෙලා අන්තිම වෙලා හිටපු නැන්ද කෙනෙක් හිටියා. අපි එයාවත් බලල තමයි ආවේ . ඝාතනය කරන්න ඉස්සෙල්ල දවසේ ප්‍රේම්ට උණක් හැදුනා .31 උදේ ඒ නැන්දා නැති වුනා .ප්‍රේම් ඒ මළ ගෙදරටත් ගිහිල්ල සවස තුනට විතර තමයි ගෙදර අවේ.ඒ එනකොට මමත් කවදාවත් නැතුව අපේ තිබුන පරණ පොත්පත් එලියට අරන් සමහර පොත් කාවෝ කාල තිබුන නිසා අව්වට වැටෙන්න වත්ත පුරාම දාලයි තිබුනේ .එදා ගෙට ඇවිත් සුපුරුදු ලෙස පුතාව අතට ගත්තම පුතා ජීවිතේ කවමදාවත් නැති විදිහට මහා හයියෙන් අඩන්න ගත්ත.ඒ ඇඩිල්ල අපි දෙන්නනටම නවත්තන්න බැරි වුනා .පැය දෙකකට විතර පස්සේ තමයි පුතා ඇඩිල්ල නැවතුවේ .

පස්සේ හවස අටේ රූපවාහිනි පුවත් බලලා එයා ඇගේ මහන්සියටත් එක්කල ඇඳේ ඇලවුනා මම පුතත් එක්ක පුතාට කිරි දීල නිදිකරන්න හැදුව .තව අපිත් එක්ක හිටිය ප්‍රේමකීර්තිගේ පුංචි අම්මගේ දුවෙකුයි පුතෙකුයි දෙන්නකුත් ඒ වෙනකොට. මම ළමයව නිදි කරලා ප්‍රේමකීර්තිගේ ඔලුව අතගෑවා.එතකොට හරිම කරුණාවකින් හරිම සංවේදී විදිහට මගේ දිහා ඇස් ඇරලා බැලූව . කවදාවත් ඒ බැල්ම මගේ මුළු සංසාරදීම මට අමතක වෙන්නෑ.මට මේ සංසාරෙන් නිවන් යනකල් ඒ බැල්ම අමතක වෙන එකක් නෑ . එක හරි අලස සුවයෙන් පසුවෙච්ච නින්දක් .ඒ එක්කම තමයි ගේ ඉස්සරහ පැත්තෙන් සද්දයක් අවේ.ඊට ටිකකට කලින් අර දුව ඇහුව මගෙන් නැන්දේ මාමටත් එක්කම උයන්න හාල් තියන්නද කියල .මම කියුව හා දුවේ මාමත් රෑට කයි කියල .එදත් හවස ප්‍රේම් සුප් හැදුව මට ළමයට කිරිදෙන්න හොදයි කියලා කිරි මාළු ඉව්ව .තව කොහිල ව්‍යංජනයක් හැදුව .මේ ඔක්කම එයා උයල අපිට තිබුනේ බත් එක උයන්න විතරයි .මොකද ප්‍රේම්ට තිබුන පුරුද්දක් උයන ගමන් එළවලූ අමුවෙන් කන පුරුද්ද .ඉතින් අර දුව දන්නවා මාම උයද්දී කනවා කියල.අන්න එකයි දුව බත් තියන්නද කියල ඇහුවේ . නාදුනන ළමයි කීප දෙනෙක් එහෙට මෙහෙට යනවත් මම දැක්ක . ඒ එක්කම කවුද දෙන්නෙක් පෙන්ටෝච් එකක් කාමරයට ගහගෙනම කවුද ප්‍රේමකීර්ති කියන්නේ කියල අහගෙන ගෙට ආව .මම දරුවත් එක්කම කාමරයෙන් එලියට එනකොට ප්‍රේමකීර්තිත් ඇඳෙන් නැගිටලා "ඇයි මල්ලි මම තමයි ප්‍රේමකීර්ති කියන්නේ" කියල කියාගෙන එලියට ආව .එතකොට ඒ ආපු පිරිස ප්‍රේමකීර්තිට කියුව ,මෙතරම් දේවල් මේ රටේ වෙලා තියෙද්දිත් අපි එපාකියන කොට වැඩට ගියා නේද අපි එපා කියද්දීත් වැඩසටහන් කළා නේද කියල .මෙයා කියුව මම එපා කියපු දවස්වල වැඩට ගියේ නැහැ වැඩසටහන් කරන්න එපා කියපු දවස්වල කලේ ආරෝග්‍යශාලා ලොතරැයිය වෙනුවෙන් කරපු වැඩසටහන විතරයි කියල .මම එතකොට මැද්දට පැනල කියුව අනේ මල්ලි මෙයාගේ දැන් නිවාඩුත් ඉවරයි ඒ නිසා සමහර වෙලාවට නිකන් අස්සන් කරලා එන්න හරි යන්න වෙනවා මල්ලි .ඔයාලට ඔය තොරතුරු දෙන අයගෙන්ම අහල හොයල බලන්න පුළුවන් ඇත්තටම ප්‍රේම් වැඩසටහන් කලාද නැද්ද ඔය කියන දවස්වල කියල . ඒ උනාට කමක් නැහැ අපිට ප්‍රේමකීර්තිට දඬුවමක් දෙන්න ඕන ගුවන් විදුලියටයි ,රූපවාහිණියටයි පාඩමක් උගන්නන්න කියල කියුව .දඬුවම තමයි බෝඩ් එකක් අල්ලාගෙන පැය විසිහතරක් හන්දියේ ඉන්න ඕන කියල .කෙනෙක් ඇහුව කෑම කෑවේ නෑ නේද තාම කියල .එතකොටම අනිත් කෙනා කියුව මේ රටේ මිනිස්සු මෙච්චර දුක් විඳිද්දී එක වේලක් නැති උනාට මොකද දැන් යමු අපිත් එක්ක කියල . යමු කියද්දී මම ඇහුව කොහේද මල්ලි මේ මහ රෑ යන්නේ ,ඔකද්ද වෙන්නේ කියල .එතකොට කියුව අක්කේ මේක රූපවාහිණියටයි ගුවන්විදුලියටයි දෙන දඬුවමක් ප්‍රේමකීර්ති බෝඩ් එකක් අල්ලන් ඉන්න ඕන කියල

.මම ආපහු අනේ මල්ලි කියද්දී කියුව දන්නවනේ මේ ඔක්කම එක උණ්ඩෙකින් අපිට පුළුවන් ඕනනම් අපිට ඕන විදිහට කරන්න .අපිට එහෙම ඕනෑකමක් නෑ ප්‍රේමකීර්තිට කරදරයක් කරන්න අපිට අවශ්‍යතාවක් නෑ අපිට ඕන රටට පාඩමක් උගන්නන්න විතරයි කියල .මම එතකොට කියුව යන ඕනෑම තැනක මාවත් අරගෙන යන්න .දෙන ඕනෑම දඬුවමක් මට දෙන්න කියල .එතකොට එක්කෙනෙක් කියුව අක්කේ මම එහෙනම් යෝජනාවක් කරන්නම් අපි ගිහිල්ල පැය තුනකට පස්සේ අක්ක එන්න කියල .පස්සේ මම එකට කැමති උනා .පස්සේ යමු කියද්දී ප්‍රේමකීර්ති සෙරෙප්පු දෙක දාගන්න හදනකොට මොකටද සෙරෙප්පු කියල ඇහුව .පස්සේ ප්‍රේම් කියුව මල්ලි ඉතින් පැය විසිහතරක් බෝඩ් එක අල්ලන් ඉන්න කොට දවල් වෙද්දී පාර රත්වෙනන්වනේ කියල .ප්‍රේම කීර්ති කියන්නේ ශරීරයෙන් කුඩා අතපය ඉතා සිළිඳු මනුස්සයෙක්

පස්සේ මම ආපහු කියුව මල්ලි මම පැය තුනකට පස්සේ තප්පරයක් නෑර ප්‍රේම් ගාව ඉන්න කියල .එතකොට හරි හරි කියල කිසිම විශේෂයක් නැතුවම අරගෙන ගියා .ඒ යද්දී පිටිපස්ස හැරිලා මගෙන් අහනවා "බව්වෝ එනවනේද එනවා නේද කියල".ඔහු මට ආදරයට කතා කලේ බව්වෝ කියල .මොකද එයාට ඒ වෙලාවේ තිබුන එකම පිහිට අර මම එනවා කියන එක විතරයි වෙන්න ඇති .පස්සේ එකපාරටම පුතාගේ ඔලූව ඉම්බ. එතන ඉඳල ගෙවුන පැය තුන මගේ ජීවිතේ නෙමෙයි මේ සංසාරේ කිසිම ගැහැනියකට අත්දක්කින වෙන්න එපා කියල මම පතනවා.ඒ පය තුන පුරාවට මම වැසිකිළි ගිය වාර ගණන මමවත් දන්නැහැ .මට ඇහුන වෙඩි හඬවල් තුනක් .මම එත් කියුව අර දුවටයි පුතාටයි අනේ පුතේ වෙඩි හඬවල් ඇහෙද්දී මාමට බයත් ඇති නේද කියල . එත් මම තුන් හිතකින් වත් හිතුවේ නැහැ ප්‍රේම්ට කරදරයක් කියල .රෑ දෙලොහට විස්සක් තියල මම එලියට ගියා අර දරුවෝ දෙන්නත් එක්ක පුතාගේ රෙදි බාස්කට් එකකට දාගෙන .මම ග්ලූකෝස් පැකට් එකකුයි බිත්තරයකුයි තව ගෙදර තිබුන විටමින් ඩී පෙති වගේකුයි ගත්ත අනේ මේ මනුස්සයට පැය විසි හතරක් මේ බෝඩ් ලෑල්ල අල්ලන් ඉන්න වෙනවා නේද කියල .මම ඉතින් නම කියකියා කෑගගහා තමයි ගියේ .මට ඉතින් හැමතැනම පෙනෙන්නේ ප්‍රේම් ඉන්නවා වගෙයි .

හන්දියට ගියහම හන්දියේ කවුරුවත් නෑ .පස්සේ පොලිසියට ගියහම පොලිසියේත් කවුරුවත් නෑ.පොලිසියත් පහු කරලා ඈතට යනකොට මට පෙනෙනවා සුදුපාට බෝඩ් එකක් අල්ලගෙන හිනාවෙවී ඉන්නවා වගේ .මම අන්න පුතේ මාම කියල සේරම දාල දිව්වහම අනේ මම දැකල තියෙන්නේ සුදුපාට හැතැප්ම කණුවක් .පස්සේ මම යටිගිරියෙන් කෑගහනකොට ටෝර්ච් එලි හතරක් ආව .ඇයි මොකද කවුද කියල අහනකොට මම විස්තරය කියුව .පසුව මම කෑගහගෙනම අපහු පොලිසියට ගියා .පස්සේ පැය ගානකට පස්සේ පොලිසියේ වාහනවලින්ම අපි ප්‍රේම්ව හොයන්න යන්න ගත්ත .ඔය වෙද්දී මට හැම තැනම පෙනෙන්නේ ප්‍රේමකීර්තිවයි .මගේ ඔලූව විකාර රූපවලින් පිරිලා .එක තැනකදී මට ඇහුන අනේ මාමේ කියල අර ළමයි දෙන්න කෑගහන සද්දේ.එතනින් එහාට වෙච්ච දේවල් මම දන්නෑ . සිහිය එද්දී මම හිටියේ මම හිතන්නේ අපහු පොලිසියේ . සමනළයෙක් වගේ අහිංසක මිනිසෙකුව නිකරුනේ මරා දැම්මේ ඇයි.?

ප්‍රේම්ව මරා දැම්මේ දේශපාලන උවමනාවකට නොවෙයි . කොහොම නමුත් මරා දමලා නැති කරන්න හදපු ප්‍රේමකීර්ති කියන නම අද වෙද්දී සදා නොමැරෙන ලෙස රසික හදවත්වල ජීවත් වෙනවා .ඔවුන් වරක් මගෙන් උදුරාගත් ප්‍රේම් මගේ හදවතේ මගේ මතකයන් තුල අදටත් සජීවී ලෙස ජීවත් වෙනව . ඒ ප්‍රේම්ව මගේ ඇස්දෙක පියවෙනකල් ඔවුන්ට උදුරගන්න බැරිබව මම හොඳාකාරවම දන්නවා .



**මගේ ගෙටත් උඩ ඔබේ ගෙටත් උඩ**
**කැළුම් දිදුළුවන සරා සුපෙම් සඳ**
**එක වහලක් යට එකට දකින්නට**
**පූරුවේ කල පෙම් මහිම කියන්නට**

**ප්‍රියේ නුබම උපනුපන් ජාති හමුවේවා .......**

**කපුරු ගොඩක් සේ අලූවත් නොරැන්දී**
**පැතූ පැතුම් පෙළ දැවී ගියා වූ**
**ජීවිතයට ඔබ අලූතින් එක්වී**
**මා ජීවත් කර සතුට ගෙනාවේ**

**ප්‍රියේ නුබම උපනුපන් ජාති හමුවේවා ....**

**කිළිටි මගේ අත ඔබට සුදුසු නැත**
**එබැවින් වෙනතක බැඳුනද කම් නැත**
**එනමුදු මෙලොවේ නැවත උපන් කළ**
**ඒ අත් භවයෙන් එළිය දකින්නට**

**ප්‍රියේ නුබම උපනුපන් ජාති හමුවේවා .......**